ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

**<u>පුවත්පත් නිවේදනය</u>**

**<u>75 වන ඉන්දීය නිදහස් දිනය රත්මලාන පරම ධම්ම චේතිය පිරිවෙනෙහිදි සැමරේ</u>**

75 වන ඉන්දීය නිදහස් දිනය 2021 අගෝස්තු 15 වන දින රත්මලාන පරම ධම්ම චේතිය පිරිවෙනෙහිදි පූජ්‍ය ආචාර්ය මාපලගම විපුලසාර මහා නායක හිමිපාණන් වහන්සේගේ සහ මහා සංඝරත්නයේ ප්‍රධානත්වයෙන් මහත් උනන්දුවකින් සැමරිණ. මෙම උත්සවයේ දී පූජ්‍ය ආචාර්ය විපුලසාර හිමිපාණන් වහන්සේ විසින් ඉන්දීය ජාතික ධජය ඔසවන ලදී. ඉන්දීය සහ ශ්‍රී ලාංකික ජනතාවගේ සුබසිද්ධිය වෙනුවෙන් විශේෂ ආශිර්වාද පූජාවක් ද පැවැත්විණ.

2. බුදු දහම ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර ආධ්‍යාත්මික සබඳතා සවිමත් කරන ශක්තිමත් බැඳීමක් බව පූජ්‍ය ආචාර්ය මාපලගම විපුලසාර හිමිපාණන් වහන්සේ මෙම අවස්ථාවේදී ප්‍රකාශ කළේය. බුදුන් වහන්සේ ජීවමාන කාලය දක්වා දිවයන දෙරට අතර ගැඹුරු බෞද්ධ බැඳීම් ද උන්වහන්සේ මෙම අවස්ථාවේදී සිහිපත් කළේය. ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර සමීප බැඳීම් ඉතිහාසය පුරාම පැවති බව ද වර්තමානයේදී එම බැඳීම් විවිධ ක්ෂේත්‍ර ආවරණය කරමින් විවිධ පැතිකඩ ඔස්සේ පැතිර පවතින බව ද උන්වහන්සේ ප්‍රකාශ කළේය. ඉන්දු - ශ්‍රී ලංකා සබඳතා ඉදිරියේදී තවදුරටත් වර්ධනය වනු ඇතැයි උන්වහන්සේ විශ්වාසය පළ කළේය.

3. පිරිවෙනෙහි අධ්‍යාපනය ලබන ඉන්දීය භික්ෂූන් වහන්සේලා ඉන්දියානු නිදහස් අරගලය පිළිබඳව කථාවන් ඉදිරිපත් කළ අතර ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර ශක්තිමත් සබඳතා වෙනුවෙන් කටයුතු කරන බව අවධාරණය කළේය. ස්වාමි විවේකානන්ද සංස්කෘතික මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂතුමා මහා සංඝරත්නයට සහ ගිහි පින්වතුන්ට දානය පිරිනැමුවේය.

4. මහ කොමසාරිස් ගෝපාල් බාග්ලේ මැතිතුමා ඉන්දීය නිදහස් දිනය පිරිවෙනෙහිදි සැමරීම වෙනුවෙන් සිය කෘතවේදීත්වය දුරකථනයෙන් ආචාර්ය විමලසාර හිමියන්ට පළ කර සිටියේය. 2020 සැප්තැම්බර් මාසයේදී අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමා සමඟ අන්තර්ජාලය ඔස්සේ පැවති ද්විපාර්ශවික සමුළුවේදී ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර බෞද්ධ සබඳතා ප්‍රවර්ධනය කිරීම සඳහා ඇමරිකානු ඩොලර් මිලියන 15ක ප්‍රදානයක් අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි මැතිතුමා විසින් ප්‍රකාශයට පත් කරන ලදී. මෙම ප්‍රදානය යටතේ සිදු කෙරෙන ව්‍යාපෘතීන් දෙරට රජයන් විසින් සැලසුම් කරමින් පවතී.

*****

කොළඹ
2021 අගෝස්තු 18